**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2022**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් ඇමතිවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනයේ අතිරික්ත මුදල් රු.5,000,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම ප්‍රායෝගිකව දුෂ්කර බැවින් ආයතනයේ පාලක මණ්ඩල අනුමැතිය සහිතව ආයෝජනය කළ බව. | මුදල් පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ කළමනාකරණ කමිටු අනුමැතියකින් හා අන්තර් හෝ අවසන් පර්යේෂණ වාර්තාවක් ලබා ගැනීමකින් තොරව 2015 ජනවාරි 01 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී නිලධාරීන් 08 දෙනෙකු වෙත රු.8,819,379 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | පර්යේෂණ යෝජනාවලට අදාළ ගෙවීම් නිර්දේශ ලිපි පමණක් ආයතනය සතුව පවතින බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| | i. 4.5 ඡේදය | ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වලට අදාළව පවත්වනු ලබන පාඨමාලාවන් අවසානයේදී ඊට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු | පාඨමාලා පවත්වනු ලබන උපරිම හා අවම කාල සීමාවන් වෙනස් වීම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වුවත්, 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරාසය තුළ ක්‍රියාත්මක කරන ලද පාඨමාලා 35 කින් ඉපයූ රු.318,338,875 ක ආදායම වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | | |
| ii. | 5.2.1 ඡේදය | ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල මුළු චක්‍ර පිරිවැයෙන් සියයට 15 සිට සියයට 30 දක්වා ප්‍රමාණයක් ආයතනයේ පොදුතාර්යය පිරිවැය සඳහා වෙන් කළ යුතු වුවද, 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පිළියෙල කරන ලද අයවැය ලේඛන 16 ක ඇතුළත් රු.125,294,096 ක් වූ අයවැය ගත ආදායමින් සංවර්ධන වැය විෂය සඳහා අදාළ වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | අප විසින් එක් එක් අධ්‍යයන මණ්ඩල වෙනුවෙන් දරන සුළු වියදම් ආයතනය විසින්ම දරනු ලබන බැවින් නැවත 5.2.1 ඡේදය ප්‍රකාරව මුදල් වෙන් කිරීමක් සිදු කරනු නොලබන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.93,665,087 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,990,259 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,674,828 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට උපයාගත් ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ 2017 වර්ෂයේ දී රු.2,100,000 කට ගිවිසුම් ගත වී එම වර්ෂයේදීම අත්තිකාරම් වශයෙන් රු.1,050,000 ක් ගෙවා තිබුණද, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 05 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | 2023 වසර අවසන් වීමට පෙර පරිගණක පද්ධතියේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | පරිගණක පද්ධතියේ කටයුතු අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය වෙත අවශ්‍ය උපකරණ ප්‍රමාණවත් ලෙස තිබියදී, කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි | ආයතනය සතුව විද්‍යාගාර පහසුකම් නොමැති නිසා පශ්චාත් උපාධි සිසුන්ගේ ප්‍රයෝගික පුහුණු හා | අවශ්‍යතාවය හඳුනා ගෙන අරමුණු ගත කාර්යන්ට අරමුදල් |

| | | | |
|---|---|---|---|
| | ආයතනය විසින් වටිනාකම රු.20,573,206 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ මිලදී ගෙන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨය වෙත ලබාදී තිබුණි. | පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යාපීඨයේ විද්‍යාගාර පහසුකම් ලබා ගැනිමට ආයතනයට සිදු වන බව. | යෙදවිය යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ආයතනය තුළ ක්‍රියාත්මක කරන ලද පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා 39ක් සඳහා කිසිදු ශිෂ්‍යයකු ලියාපදිංචි කර නොතිබුණි. | විවිධ මාධ්‍ය හරහා ප්‍රමාණවත් ප්‍රචාරණයක් ලබා දී තිබුණද ආර්ථිකමය හා සාමාජීය වශයෙන් ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් වීම හේතුවෙන් සිසුන් බඳවා ගැනීම අඩු වී ඇති බව. | සියලු පාඨමාලාවන් සඳහා උපරිම ධාරිතාවයෙන් යුක්තව සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාත්‍යන්තර පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (IDRC) වෙතින් හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ප්‍රදාන යටතේ පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණු රු. 1,614,830 ක් වසර 02 සිට වසර 03 ක කාලයක සිට උපයෝජනය කිරීමට කටයුතුකර නොතිබුණි. | මේ වන විට මෙම පර්යේෂණයට අදාළ සිසුන් පර්යේෂණයන් අවසන් කර හා අවසන් කරමින් පවතින බැවින් 2023 වර්ෂයේදි සියළුම වියදම් පියවා දමා පර්යේෂණ කටයුතු නිමා කිරීමේ හැකියාවක් පවතින බව. | අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත හා කාර්යක්ෂම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාතරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිළධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිළධාරීන් 22 දෙනෙකු වසර 05 සිට වසර 34 දක්වා කාලයක් එකම ස්ථානයක සේවයේ යොදවා තිබුණි. | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් අනුබද්ධ ආයතනයක් වුවත්, ආයතනයේ සේවය කරන කාර්ය මණ්ඩල ස්ථාන මාරුවීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා කිරීමට සිදුවීම ස්ථිර මාරු ප්‍රතිපත්තියක් සකස්කිරිමේ දි ආයතනය මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් බව. | විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිළධාරීන් සේවයේ යෙදවිය යුතුය. |